**මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම - 2024**

**-------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**කරුණු අවධාරණය කිරීම**

2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙන් කිරීමත් සමඟ මැනේජ්මන්ට් සර්විසස් රක්‍ෂණ (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථා සමාගම වෙත ද්විතීයනය කරන ලද සේවකයන් 2024 පෙබරවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙන් කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර ඇති බව විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන 2 පිළිබඳව මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව මාගේ අවධානය යොමු කරමි.

සේවකයින් සම්බන්ධව පවතින නෛතික කරුණු හේතුවෙන්, මෙම ගැටළු සම්පූර්ණයෙන්ම විසඳන තෙක් මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. නොවිසඳුණු සියලු නඩු විසඳා ගත් පසු, කළමනාකාරිත්වය විසින් තත්ත්වය ඇගයීමට ලක් කර සමාගම වසා දැමීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත. ඒ අනුව, අඛණ්ඩ පැවැත්ම මූලධර්මය පිළිබඳ උපකල්පනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ (මව් සමාගම) ගෙවීම් වවුචර් සමාගමේ ගෙවීම් සඳහා උපයෝගී කරගෙන ඇති බව නිරීක්ෂණය විය. සමාගම වෙනම නෛතික ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන බැවින්, තමන්ගේම ගෙවීම් වවුචර් භාවිතා කිරීම අවශ්‍ය වේ. 2007 අංක 07 දරන සමාගම් පනතේ 12 වන වගන්තියට අනුව, | මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම (MSRPL) වෙනම නෛතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම ඓතිහාසිකව මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම (MSRPL) වෙනුවෙන් සියලුම ගෙවීම් තමන්ගේම බැංකු ගිණුම් හරහා හසුරුවා ඇත. පසුව, මෙම වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ | සියලුම මූල්‍ය ගනුදෙනු තමන්ගේම නමින් සිදු කරන බව සහතික කිරීම සඳහා සමාගම ගෙවීම් වවුචර් පද්ධතියක් සහ අදාළ ක්‍රියා පටිපාටි ස්ථාපනය කළ යුතු බව නිර්දේශ කෙරේ. සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 12 වන වගන්තියට |

| | | |
|---|---|---|
| ව්‍යාපාරය වෙනුවෙන් අත්සන් තබා ඇති සියලුම විනිමය බිල්පත්, චෙක්පත් සහ මුදල් හෝ නිෂ්පාදන සඳහා ඇණවුම් මෙන්ම සියලුම ලිපි හුවමාරු, ඉන්වොයිසි සහ ණයවර ලිපිවල සමාගමේ නම සහ සමාගම් අංකය කැපී පෙනෙන ලෙස දිස්වන බවට ව්‍යාපාරය මගින් සහතික විය යුතුය. | (පුද්ගලික) සමාගම (MSRPL) විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඉන්වොයිසි නිකුත් කරයි.<br><br>මෙය අපගේ අභ්‍යන්තර මූල්‍ය ක්‍රියා පටිපාටිවලට අනුකූල වන අතර කාර්යක්ෂමතාව සහ නිසි මූල්‍ය අධීක්ෂණය සහතික කරමින්, මධ්‍යගත ගෙවීම් සැකසීමට පහසුකම් සලසයි.<br><br>එපමණක් නොව, මෙම පිළිවෙත අදාළ ප්‍රමිතීන් සහ නියාමන අපේක්ෂාවන්ට අනුකූල බව තහවුරු කරමින් ඉකුත් වර්ෂවලදී විගණකවරුන් විසින් සමාලෝචනය කර පිළිගෙන ඇත. | අනුකූලව කටයුතු කරන බව ද සහතික කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. ආයුගණක තක්සේරුව පිළිබඳ වාර්තාවට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම රු. 163,524,724 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල අංක 03 දරන සටහනට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ රු. 165,046,174 ක පාරිතෝෂික වගකීමක් සටහන් කර තිබුණි. සියලුම සේවකයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර තිබීම හේතුවෙන්, වෙන් කිරීම අනුගමනය කිරීම මගින් රු. 163,524,725 ක් වූ පාරිතෝෂික වගකීම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර තිබුණි. කෙසේ වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල රු.1,521,452 ක ශුද්ධ වගකීමක් පැවතුනි. මෙම ඉතිරි පාරිතෝෂික වගකීම් මුදල සඳහා කිසිදු පැහැදිලි කිරීමක් හෝ ලේඛනගත සාක්ෂියක් ලබා දී නොමැත. | මෙම ශේෂය 2021 වර්ෂයේ දී වාර්තා නොකළ වියදමකින් පැන නැගී ඇති දිගුකාලීන හිඟ ශේෂයකි.<br><br>සියලුම සේවකයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර ඇති බැවින්, අදාළ පාරිතෝෂික වගකීම 2024 පෙබරවාරි 01 වන දින අදාළ සමාගම් වෙත මාරු කර ඇත. | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය, විනිවිදභාවය සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූල වීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ඉතිරි පාරිතෝෂික වගකීම විමර්ශනය කර සැසඳිය යුතු බව නිර්දේශ කෙරේ. |

## 1.6 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. 2024 පෙබරවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙන් කිරීමෙන් පසුව, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ (MSRPL) කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2024 වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් කටයුතු සැලකිය යුතු මට්ටමින් අඩු විය. සීමිත මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ අඛණ්ඩ ව්‍යාපාර ගනුදෙනු නොමැති වීම හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු මට්ටමේ සැකයන් ඇති වේ. | සේවකයින් සම්බන්ධව පවතින නෛතික කරුණු හේතුවෙන්, මෙම ගැටළු සම්පූර්ණයෙන්ම විසඳන තෙක්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ (MSRPL) මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාමට මණ්ඩලය තීරණය කර ඇත. ඉතිරිව ඇති සියලුම නඩු විසඳා ගැනීමෙන් අනතුරුව, කළමනාකාරීත්වය විසින් තත්ත්වය ඇගයීමට ලක් කර සමාගම වසා දැමීමේ හැකියාව සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත. | සමාගමේ වත්මන් මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ධාරිතාව සහ අනාගත මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණ සැලකිල්ලට ගනිමින්, අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පුළුල් තක්සේරුවක් සිදු කළ යුතු බව නිර්දේශ කෙරේ. මෙම තක්සේරුව මත පදනම්ව, කළමනාකරණය විසින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇත් නම් එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. 2018 වර්ෂයේ දී මුලින් තැන්පත් කරන ලද රු. 1,000,000 ක ස්ථාවර තැන්පතුවක් 2024 ජනවාරි 31 දිනට රු. 1,630,247 ක් දක්වා සමුච්චය වී ඇති බව නිරීක්ෂණය විය. අරමුණු සහ මෙහෙයුම් ස්වභාවය සලකා බැලීමේදී, වර්තමානයේ සමාගම මෙහෙයුම් සම්බන්ධයෙන් අක්‍රියාකාරීව පවතී. එබැවින්, මෙම තැන්පතුව නිශ්කාර්යව පවතින අතර එය වටිනාකමක් උත්පාදනය කිරීමට ඵලදායී ලෙස භාවිත කිරීම හෝ ආයතනික ඉලක්ක සපුරා ගැනීමට සහාය වීම හෝ සිදු නොවේ. | සමාගම වසා දැමීමේදී, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම සතු ස්ථාවර තැන්පතුව සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් අවසන් තීරණයක් ගනු ඇත. මෙම තීරණය සමස්ත මූල්‍ය තක්සේරුව මත සමාගමේ වසා දැමීමේ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ගනු ලැබේ. | සමාගමේ අරමුණු සහ මූල්‍ය උපාය මාර්ගයට අනුකූලව ස්ථාවර තැන්පතුව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විචාරාත්මකව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කරනු ලැබේ. ක්‍රියාකාරී මෙහෙයුම් නොමැති විට, සමාගම විසින් නැවත ආයෝජනය කිරීම වැනි ආදායම් උත්පාදනය කිරීමේ විකල්ප පිළිබඳව සලකා බැලිය යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 192,220 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු. 6,954,068 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,761,848 ක පිරිහීමක් නිරීක්ෂණය විය. 2024 පෙබරවාරි 1 දින සිට මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ (MSRPL) කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්

ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2024 වර්ෂය තුළ සමාගමේ කළමනාකරණ ගාස්තුව රු. 809,576,651 කින් අඩු වීම මෙම පිරිහීමට හේතු විය.

## 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල විශ්ලේෂණය ඉකුත් වර්ෂ හතරක (04) කාල පරිච්ඡේදය හා සැසඳීමේදී, ඒවායේ වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පහත දක්වා ඇත.

| රේඛීය අයිතමය | 2024<br>රු. '000 | 2023<br>රු. '000 | 2022<br>රු. '000 | 2021<br>රු. '000 | 2020<br>රු. '000 |
|---|---|---|---|---|---|
| **කළමනාකරණ ගාස්තු** | **84,702** | **894,279** | **783,149** | **739,905** | **700,922** |
| විචලනය | -809,577 | 111,130 | 43,244 | 38,983 | 117,400 |
| වැඩිවීම/ (අඩුවීම) | -91% | 14% | 6% | 6% | 20% |
| **වැටුප්** | **38,048** | **378,119** | **329,202** | **304,247** | **293,090** |
| විචලනය | -340,071 | 48,917 | 24,955 | 11,157 | 48,323 |
| වැඩිවීම/ (අඩුවීම) | -90% | 15% | 8% | 4% | 20% |
| **දිරි දීමනා/ නිවාඩු/ ප්‍රසාද දීමනා** | **14,321** | **232,833** | **189,532** | **214,591** | **187,944** |
| විචලනය | -218,512 | 43,301 | -25,059 | 26,647 | 44,168 |
| වැඩිවීම/ (අඩුවීම) | -94% | 23% | -12% | 14% | 31% |
| **අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය** | **550** | **6,050** | **3,126** | **5,099** | **10,178** |
| විචලනය | -5,550 | 2,924 | -1,973 | -5,079 | -44,324 |
| වැඩිවීම/ (අඩුවීම) | -91% | 94% | -39% | -50% | -81% |
| **පරිපාලන ආදායම** | **84,559** | **878,367** | **756,341** | **729,451** | **693,852** |
| විචලනය | -793,808 | 122,026 | 26,890 | 35,599 | 118,051 |
| වැඩිවීම/ (අඩුවීම) | -90% | 16% | 4% | 5% | 21% |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාංගමික සංස්ථා පත්‍රය අනුව, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම (MSRPL) පහත සඳහන් මූලික අරමුණු සහිතව ස්ථාපනය කරන ලදී.<br><br>• රක්ෂණ කළමනාකරණ සහ තාක්ෂණික සේවා සැපයීම<br>• රක්ෂණ උපදේශාත්මක සහ උපදේශන සේවා සැපයීම<br>• රක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම<br>• සාමාන්‍ය කළමනාකරණ සහ උපදේශන සේවා සැපයීම<br><br>කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම (MSRPL) මගින් බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය, වෙන් කිරීමට පෙර අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටියට අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමට ද්විතීයනය කරන ලදී. උපායමාර්ගික සැලැස්ම සහ ව්‍යාපාරය මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සකස් කරන ලදී.<br>ඒ අනුව, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම වෙතින් ද්විතීයනය කරන ලද | මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම (MSRPL) දැනට කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් හෝ උපායමාර්ගික අරමුණක් නොමැතිව අක්‍රියව පවතින බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ අනාගතය පිළිබඳව තක්සේරු කර, සමාගම නැවත සක්‍රිය කිරීම හෝ ඇවර කිරීම සම්බන්ධයෙන් විධිමත් තීරණයක් ගත යුතු බව නිර්දේශ කරනු ලැබේ. |

ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ලෙස වෙන් කිරීමෙන් පසුව, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙත අනුයුක්ත කරන ලද සියලුම සේවකයින් පසුව මෙම නව ආයතන දෙකට මාරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම සතුව තවදුරටත් එහි අරමුණු හා සම්බන්ධ කිසිදු සේවකයෙකු හෝ මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැත.

වර්තමානයේ, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම ක්‍රියාකාරී නොවන සමාගමක් ලෙස පවතින අතර, එයට නිශ්චිත උපායමාර්ගික අරමුණක්, ක්‍රියාකාරී ව්‍යාපාරික කටයුතු හෝ මෙහෙයුම් රාමුවක් හෝ නොමැත. සමාගමේ පැවැත්ම අක්‍රිය තත්ත්වයක පවතින අතර, නැවත සක්‍රිය කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම හෝ ඈවර කිරීම යනාදි ආකාරයකින් එහි අනාගතය පිළිබඳ පැහැදිලි තීරණයක් ගෙන නොතිබුණි.

ජොෂ්ඨ කළමනාකරුවන් සඳහා තනි පුද්ගල ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) පවරන ලදී.

වෙන් කිරීමෙන් පසුව, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම වෙත ද්විතීයනය කරන ලද සේවකයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කරන ලදී. වර්තමානයේ, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම යනු අක්‍රිය සමාගමකි.

## 4. වගකිවයුතුබව සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියට අනුව, සෑම විගණනය කරනු ලබන අස්තිත්වයක් සඳහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා නිසි ලෙස පත් කරන ලද අභ්‍යන්තර විගණකවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර විගණන කාර්යයක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ දී කළමනාකාරිත්වය බාහිර පාර්ශවයන් සමඟ අභ්‍යන්තර විගණනයක් ආරම්භ කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් යම් දියුණුවක් ඇති විය. කෙසේ වුවද, සියලුම සේවකයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර ඇති බැවින් සහ දැනට අඛණ්ඩ මෙහෙයුම් නොමැති බැවින්, අභ්‍යන්තර විගණනයක් සඳහා අවශ්‍යතාවයක් පැන නොනගින බව අපි විශ්වාස කරමු. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියට අනුකූල වීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ වත්මන් මෙහෙයුම් තත්ත්වය පිළිබඳව විධිමත් ලෙස ඇගයීමට ලක් කර ලේඛනගත කළ යුතු බව සහ මෙම සුවිශේෂී තත්වයන් යටතේ අභ්‍යන්තර විගණන කාර්යයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය තක්සේරු කළ යුතු බව නිර්දේශ කෙරේ. |